Welcome

# LakRuhuna

Get more to your Life….

Welcome

# LakRuhuna

PANSALA E - PUDLISHING

LAKRUHUNA

ආයුබෝවන්...

# ලක්රුහුණ

විද්‍යුත් මාධ්‍ය ප්‍රකාශණ

LAKRUHUNA

චතුරාර්ය සත්‍යාවබෝධයට ධර්ම දේශනා....

# සිත සනසන අමාගඟුල

කපුගම සුධර්මාරාමාධිපති

මාතර ශ්‍රී සුදර්ශි පිරිවෙනේ පරිවේනාධිපති ශාස්ත්‍රපති විචිත්‍ර ධර්ම දේශක

## පූජ්‍ය කපුගම සුගතසාර හිමිපාණෝ

විසින් පවත්වන ලද වැඩසටහන් වලදී දේශනා කරන ලද සූත්‍ර දේශනා ඇසුරෙනි.

පරිගණක අකුරු සැකසුම

පිටකවර නිර්මාණය :

ප්‍රකාශනය : ලක්රුහුණ.com

මුද්‍රණය :

*නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස !!!*

*"මිච්ඡා මනං පනීධාය මිච්ඡා වාචංච භාසිය*
*- මිච්ඡා කම්මානි කත්වාන කායේන ඉධ පුග්ගලෝ*
*අප්පස්සුතෝ පුඤ්ඤකරෝ අප්පස්මිං ඉධ ජීවිතේ*
*- කායස්ස භේදා දුප්පඤ්ඤෝ නිරයංසෝ උපපජ්ජතී" ති*

*බුද්දක නිකාය මිච්ඡාදිට්ඨී කම්ම සමාදාන සූත්‍රය*

# නිවැරදිව සිතා නිවැරදි ක්‍රියාකර අළුත් අවුරුද්දට සූදානම් වෙමු.

ශ්‍රද්ධාවන්ත පින්වත්නි,

අද මැදින් මස පුර පෝ දිනයයි. බුදුරජාණන් වහන්සේ කිඹුල්වත්පුරට වැඩමවීමට ගමන ආරම්භකල දිනය සිහිපත්කෙරෙන දිනයයි. එමෙන්ම තව ටික දිනකින් සිංහල අලුත් අවුරුද්ද ද උදා වේ.

බුදුරජාණන් වහන්සේගේ ධර්මය ලෞකික ලෝකෝත්තර යන දෙපැත්තටම සෙත සලසන අනුපමේය (උපමාකල නොහැකි) දහමකි. එබැවින් ඉහත සඳහන් සූත්‍රපාඨයට අනුව එම බණ පදය තේරුම්ගෙන අලුත් අවුරුදු උත්සවය සහ අපේ ජීවිතය කෙසේ විය යුතුද යන්න තේරුම් ගනිමු. ඉහත මාතෘකා ගාථා දෙකෙහි සරළ අදහස මෙයයි. "මෙලොව යමෙක් සිත වැරදි ලෙස පිහිටුවා වැරදි ක්‍රියා සිදු කොට මිනිස් ලොව ජීවත් වන සුළු කාලය ඇසූ පිරූ තැන් (බහුස්සුත) නැතිව අකුසල් කරන නුවණ නැති පුද්ගලයා මරණින් මතු නරකයෙහි උපදී."

මෙම සූත්‍රයෙන් බුදු හිමියන් පෙන්වාදෙනුයේ වැරදි සහගත දුශ්චරිත දිවි පෙවෙතින් යුතු පුද්ගලයෙකුට අත්වන සංසාරගත ඉරණමයි. උන් වහන්සේ කෙනෙකුගෙන් අසා දැනගෙන ආරංචියෙන් නොව තමන් වහන්සේම නුවණින් අවබෝධයෙන් "දිට්ඨා මයා භික්ඛවේ සත්තා ...." යි, "මා විසින් දක්නා ලදහ" යි වදාරා ඇත.

වැරදි සහ නිවැරදි දැකීම මිච්ඡා දිට්ඨිය සහ සම්මා දිට්ඨිය යනුවෙන් සරළව ඉගැන්වේ. ඒ අනුව දුක්සහිත වූ සසරින් මිදීමට ඇති එකම මාර්ගය ආර්ය අෂ්ඨාංගික මාර්ගයයි. එහි පළමු මාර්ග අංගය සම්මා දිට්ඨියයි. සසර දුක් රැස් කිරීමේ මාර්ගය මිච්ඡා දිට්ඨියයි. නිවැරදි දැකීමක් තුල යමෙක් යම් පමණට හැසිරේද එපමණට ඔහුගේ සසර සැපවත්වෙයි. බුදු හිමියන්, පිරිණිවන් මංචකයේදී සුභද්‍ර නම් වූ අන්තිම ශ්‍රාවකයා හට ඉතාම කෙටියෙන් පැහැදිළි කළේද "සුභද්‍රය නිවැරදි මාර්ග අංග අටකින් මග පෙන්වන එකම දහම තථාගත ශාසනයේ පමණක් දැකිය හැකි බවයි. විඳිය හැකි (වේදයිත) කම් සැපද නොවිඳින (අවේදයිත) විමුක්ති සැපයද මෙම මාර්ග අංග අටේ හැසිරෙන්නාට ඒකාන්තය. එයින් පළමු මාර්ග අංගයෙන් ඉගැන්වෙන සම්මා දිට්ඨිය හෙවත් නිවැරදි දැකීමෙහි අගයත් වැරදි දැකීමෙහි හානියත් මෙයින් පැහැදිළි වෙති.

ඉහත දැක්වූ සූත්‍ර පාඨයෙන් පැහැදිළි වන ත්‍රිවිධ දුශ්චරිතයෙන් යුතු කම් ඇති සත්වයෝ මරණින් මතු නිරයෙහි උපදින බව බුදු නෙතින්ම දැක දේශණා කළ බව සූත්‍රයේ දැක්වේ. "ලෝකවිදූ ගුණයෙන් යුතු වන්නේ මෙම දැකීමේ හේතුව නිසාය. සත්ව, අවකාශ, සංස්කාර වශයෙන් ලෝකය තුන් ආකාර වේ. බුදු රජාණන් වහන්සේ මෙය ප්‍රත්‍යක්ෂ කොට වැරදි මත දැරීම දුක් සහිත හෙයින් දස අකුසලයන්ගෙන් දස වැනි අකුසලය ලෙස දක්වත

වැරදි මතය සිතකට තහවුරු වනුයේ,

01. වැරදි දැකීම ගන්නා වූ ආකාරයේ වැරදි බවද

02. එයම සත්‍ය යැයි තීරණයකට පැමිණීමත්ය.

මිසදිටු බව වශයෙන් මෙය හඳුන්වයි. බොහෝ දෙනාට මෙම වැරදි ආකල්ප ඇති වීමට එවැනි අය ඇසුරු කිරීම ඊට හේතු වෙති. ලෝකයේ

වැඩිදෙනෙක් සත්‍ය පිළිබඳ මනා වැටහීමක් නැත. එවන් පුද්ගලයෝ පහසුවෙන් මුලාවෙති. වැරදි මත දරන්නෝ රසවත් කොට වැරැද්දම පෙන්වති. එබැවින් වැරදිමත දරන්නා සර්පයෙකු ලෙස සලකා දෙලොව වැඩ කැමති නුවණැතියෝ එවැන්නන් දුරින්ම දුරුකළ යුතු බව දේශණා කොට ඇත.

දෙලොව වැඩ කැමති මනුෂ්‍යයින් වශයෙන් වත්මන් ලෝකයේ අප වැරදි ආකල්ප තුලින් කෙතරම් දුරට වෙන් වී දැයි විමසා බලමු. එදිනෙදා ජීවිතයේ කුදුමහත් හැම කටයුත්තකදීම අප කෙතරම් නිවැරදිදැයි විමසිලිමත් වෙමු.

සිංහල අවුරුදු උත්සවය තව ටික දිනකින් අප මුහුණ දෙන එවන් අවස්ථාවකි. තුන්කල් දක්නා නුවණ ඇති ධ්‍යානලාභී මහ ඍෂිවරුන් සොයාගත් ලෞකික, ගණිතමය ශාස්ත්‍රයකි ජ්‍යෝතිශය. එම ශ්‍රාස්ත්‍රය හින්දු දහමද පදනම්කරගෙන විශ්වග්‍රහ වස්තූන් අතරින් සූර්ය ග්‍රහ වස්තුව මුල්කොට සිදුවන්නා වූ ග්‍රහ සංසිද්ධියට අනුව සිදු කරන ජාතික උත්සවය සිංහල බෞද්ධ ජනතාවද සිදු කරති. එබැවින් සූත්‍ර දේශණාවට අනුව ඊට මුහුණ දියයුතු ආකාරය කරුණු හතරක් තුළින් දකිමු.

★ නිවැරදි මග ගිය ආර්යය උතුමන්ට ගරු කරමු. ("අරියානං අනුපවාදතා")

අප තෙරුවන් සරණ ගිය පස්පව් නොකරණ සීලය මුල් කොටගත් බෞද්ධයෝය. බුදු හිමියන් අපගේ මාර්ගෝපදේශකයාණෝය. උන් වහන්සේගේ වචනයට ගරු කරන්නෝය. අනුගාමික ආර්යයන් වහන්සේලාට ගරු කරන්නෝය. තෙරුවන් සරණ ගිය ජනතාවක් ලෙසට අවංකව, නිවැරදි දැකීමක් තුල හැසිරිය යුතුය. කරණීය මෙත්ත සූත්‍රයේ " නච බුද්දං සමාචරේ ....." යනාදී ගාථාවට

අනුව "යම් ක්‍රියාවක් නුවණැති අන් කෙනෙක් නින්දා කෙරේත්ද එසේ ස්වල්ප වූ හෝ ත්‍රිවිධ දුශ්චරිතයක් නොකළ යුතුය."

හින්දු දහම පවතින රටක හින්දු දහමට අනුව ජ්‍යොතිශය හැම කටයුතුත්තක්ම සිදු කිරීමට උපදෙස් ලැබීම පුදුමයක්නොව. ජ්‍යොතිශය විද්‍යාවකි. හින්දු දහම ආගමකි. බෞද්ධයාට ජ්‍යොතිශය ලෞකික විද්‍යාවකි. බුදුදහම දර්ශනයකි. මේ බව හොඳින් තේරුම්ගෙන අවුරුදු උත්සවයට නිවැරදි දැකීමක් ඇතිකරගත යුතුය. බුදු දහමට අනුව ජ්‍යොතිශය උපයෝගිකර ගන්නවා විනා ජ්‍යොතිශයට අනුව දහම උපයෝගි කර ගැනීම යුතු නොවේ. හින්දූන් දහමට අනුව ජ්‍යොතිශය උපයෝගිකර ගෙන ඒ අනුව අවුරුදු චාරිත්‍ර කරති. හින්දු දෙවිවරුන්ට ඒ තුලින් නින්දා නොවෙති. බෞද්ධයෝද බුදුරජාණන් වහන්සේට සහ ධර්මයට අගෞරව නොවන ලෙසට එම කටයුතුද කළ යුතු වේ. මෙලොවදීම බොහෝ සැප ලැබේ. දෙවියන්ටද යාඥා කළයුතු නොවේ.

වැරදි මතය සිතකට තහවුරු වනුයේ,

**01. වැරදි දැකීම ගන්නා වූ ආකාරයේ වැරදි බවද**

**02. එයම සත්‍ය යැයි තීරණයකට පැමිණීමත්ය.**

මිසදිටු බව වශයෙන් මෙය හඳුන්වයි. බොහෝ දෙනාට මෙම වැරදි ආකල්ප ඇති වීමට එවැනි අය ඇසුරු කිරීම ඊට හේතු වෙති. ලෝකයේ වැඩිදෙනෙක් සත්‍ය පිළිබඳ මනා වැටහීමක් නැත. එවන් පුද්ගලයෝ පහසුවෙන් මුලාවෙති. වැරදි මත දරන්නෝ රසවත් කොට වැරැද්දම පෙන්වති. එබැවින් වැරදිමත දරන්නා සර්පයෙකු ලෙස සලකා දෙලොව වැඩ කැමති නුවණැතියෝ එවැන්නන් දුරින්ම දුරුකළ යුතු බව දේශණා කොට ඇත.

දෙලොව වැඩ කැමති මනුෂ්‍යයින් වශයෙන් වත්මන් ලෝකයේ අප වැරදි ආකල්ප තුලින් කෙතරම් දුරට වෙන් වී දැයි විමසා බලමු. එදිනෙදා ජීවිතයේ කුදුමහත් හැම කටයුත්තකදීම අප කෙතරම් නිවැරදිදැයි විමසිලිමත් වෙමු.

සිංහල අවුරුදු උත්සවය තව ටික දිනකින් අප මුහුණ දෙන එවන් අවස්ථාවකි. තුන්කල් දක්නා නුවණ ඇති ධ්‍යානලාභී මහ ඍෂිවරුන් සොයාගත් ලෞකික, ගණිතමය ශාස්ත්‍රයකි ජෝතිශය. එම ශ්‍රාස්ත්‍රය හින්දු දහමද පදනම්කරගෙන විශ්වග්‍රහ වස්තූන් අතරින් සූර්ය ග්‍රහ වස්තුව මුල්කොට සිදුවන්නා වූ ග්‍රහ සංසිද්ධියට අනුව සිදු කරන ජාතික උත්සවය සිංහල බෞද්ධ ජනතාවද සිදු කරති. එබැවින් සූත්‍ර දේශණාවට අනුව ඊට මුහුණ දියයුතු ආකාරය කරුණු හතරක් තුළින් දකිමු.

**නිවැරදි මග ගිය ආර්යය උතුමන්ට ගරු කරමු. ("අරියානං අනුපවාදතා")**

අප තෙරුවන් සරණ ගිය පස්පව් නොකරණ සීලය මුල් කොටගත් බෞද්ධයෝය. බුදු හිමියන් අපගේ මාර්ගෝපදේශකයාණෝය. උන් වහන්සේගේ වචනයට ගරු කරන්නෝය. අනුගාමික ආර්යයන් වහන්සේලාට ගරු කරන්නෝය. තෙරුවන් සරණ ගිය ජනතාවක් ලෙසට අවංකව, නිවැරදි දැකීමක් තුල හැසිරිය යුතුය. කරණීය මෙත්ත සූත්‍රයේ " නච බුද්දං සමාචරේ ....." යනාදී ගාථාවට අනුව " යම් ක්‍රියාවක් නුවණැති අන් කෙනෙක් නින්දා කෙරෙත්ද එසේ ස්වල්ප වූ හෝ ත්‍රිවිධ දුශ්චරිතයක් නොකළ යුතුය."

හින්දු දහම පවතින රටක හින්දු දහමට අනුව ජ්‍යොතිශය හැම කටයුතුත්තක්ම සිදු කිරීමට උපදෙස් ලැබීම පුදුමයක්නොව. ජ්‍යොතිශය විද්‍යාවකි. හින්දු දහම ආගමකි. බෞද්ධයාට ජ්‍යොතිශය ලෞකික විද්‍යාවකි. බුදුදහම දර්ශනයකි. මේ බව හොඳින් තේරුම්ගෙන අවුරුදු උත්සවයට නිවැරදි දැකීමක් ඇතිකරගත යුතුය. බුදු දහමට අනුව ජ්‍යොතිශය උපයෝගිකර ගන්නවා විනා

ජ්‍යොතිශයට අනුව දහම උපයෝගි කර ගැනීම යුතු නොවේ. හින්දූන් දහමට අනුව ජ්‍යොතිශය උපයෝගිකර ගෙන ඒ අනුව අවුරුදු චාරිත්‍ර කරති. හින්දු දෙවිවරුන්ට ඒ තුලින් නින්දා නොවෙති. බෞද්ධයෝද බුදුරජාණන් වහන්සේට සහ ධර්‍මයට අගෞරව නොවන ලෙසට එම කටයුතුද කළ යුතු වේ. මෙලොවදීම බොහෝ සැප ලැබේ. දෙවියන්ටද යාඥා කළයුතු නොවේ.

**මිනිස්ලොව ජීවත්වන කාලය සුළුය. ("අප්පස්මිං ඉධ ජීවිතේ")**

සිංහල අවුරුදු චාරිත්‍ර තුල ආයුෂය, වර්‍ණය, සැපය සහ බලය නිරෝගීකම රැකීමේ සිරිත් වලට මුල්තැන දෙති. ඒ බව, ස්නානය, හිසතෙල්ගෑම, පුණ්‍ය කාලය, ආහාර අනුභවය, වස්ත්‍ර ඇඳීම ආදී කරුණු වලින් පැහැදිළිවෙති. බෞද්ධයා මේ හැම කාරණයකදීම වයසින්, ගුණයෙන් නුවණින් සීලයෙන් වැඩිහිටියන් මුල්කරගෙන ඒ ඒ අයට වැඳීම් පිදීම් කිරීමෙන් එම කටයුතු කරති.

"ඉෂ්ඨ දේවතානුස්මරණයෙහි යෙදී" යනුවෙන් හින්දු දහමට අනුව කියනුයේ බෞද්ධයාට බුද්ධානුස්සතියයි. ධජග්ග සූත්‍රයේදී තම ශ්‍රාවකයින්ට බුදු හිමියන් අවවාද කළේ

**ඒවං බුද්ධං සරන්තානං - ධම්මං සඞ්ඝංච භික්ඛවෝ**

**භයං වා ඡම්භිතත්තං වා - ලෝමහංසෝ නහෙස්සති**

"මහණෙනි බුදුන්ද ධර්‍මයද ආර්‍ය්‍ය සංඝයා ද සිහිකරන්නවුන්ට බියක් තැති ගැන්මක්, රෝමෝද්ගමනයක් නොවේ." යනුවෙනි. මෙය නොනගත කාලයේදී ඉතා හොඳ ඉෂ්ඨදේවතානුස්මරණයයි.

අපේ ඇතැම් සිංහල බෞද්ධයෝ හින්දු දහමටවත්, බුදු දහමටවත් නැති කටයුතු කරති. හින්දූන් එම කටයුතු අදටත් සිදු කරන ආකාරය මාධ්‍ය තුලින් ඉස්සරට වඩා දැන් ඇසිය දැකිය හැකි වේ. හොඳින් විමසා බලන්න! පංචශීල ප්‍රතිපත්තිය අවුරුදු උත්සවයේදී අකුරටම ඉශ්ඨකරණුයේ හින්දූන් නොවේද? ඇතැම් බෞද්ධ නිවෙස්වල ගෘහනියගේ අප්‍රතිහත ධෛර්යයෙන් චාරිත්‍ර කිරීමට වෙරදරති. අලුත් අවුරුදු මේසය රෝග නිවාරණය කරන තැනක් විය යුතුය. එහෙත් රෝග ආවරණය කරන තැනක් බවට දැන් දැන් පත්වෙති. පැරණි බෞද්ධයා ගේදොර සෝදා ගොම මැටි ගා පිරිසිදු කොට මංගල සම්මත පොල්තෙල් පහන, බුලත් හුරුළු, කැවුම් කිරිබත් සම්බන්ධ කොට සිදු කලහ. අද එම නිරෝගී ආහාර වෙනුවට කල් ඇතිවම ශීතකරණතුල ගබඩාකර තිබූ විවිධ මස් වගී මාළු, කරවල, සැමන්, බිත්තර සහ මත් වතුර සම්බන්ධ කර ගනුයේ බෞද්ධයා පමණකි. මේ පිළිවෙත් කොතනින් ආවාදැයි ආපසු හැරී බැලිය යුතුය. හින්දු ආගමිකයින් ගවයා පූජනීයත්වයෙන් පුදා එළකිරි, අලුත් සහල්, ධාන්‍ය උපයෝගීකරති. චාරිත්‍ර කිරීමට පිරිමි මුලික වෙති. ඇතැම් බෞද්ධ පිරිමි ඊට අනුගත නොවෙති. ඔවුන් නැතැත් චාරිත්‍ර වේලාවන්හිදී ද සොහොන් පිටි, පාළු ගෙවල්, මහ මග, අලුත් ඇඳුම් කෙසේ වෙතත් ඉන තිබූ පරණ ඇඳුමත් නැතිව බලු කපුටන් සමග ඉඳුල් කරති ගණදෙනු කරති.

බුදු හිමියන්ගේ අවුරුදු පණිවිඩය අනුව නොනගතය හෙවත් පුණ්‍ය කාලය බෞද්ධයා ගත කළ යුත්තේ පවුලෙම අය එකතු වී ගමේ පන්සල ස්වාමීන්වහන්සේලා, බෝමළුව, චෛත්‍ය මළුව ඇසුරු කොටය. එයින් ලද ආශිර්වාදය මත නිවැරදි ක්‍රියා සමාදානයට පසුබිම ඉබේටම සැකසේ.

බෞද්ධයා තරම් මිනිස් ආයුෂ කෙටිබව දන්නා කෙනෙක් ලෝකයේ මිනිසුන් අතර වෙන නැත. එනමුත් එම ගතවන වසරේ කෙනෙකු මිය ගියේනම් ඇතැමුන් නැකැත් චාරිත්‍ර ඉටු නොකරති. කිරිබත් පමණක් නොකති. වැඩිහිටි සංග්‍රහ නොකරති. ආචාර ධර්‍ම නවතා "අපිට මෙවර අවුරුද්දක් නැතැයි" කියා මත්පැන් බොමින් වේගරිද්ම ශබ්ද හඬපටි ගීත වාදනය කරමින් අසල්වාසීන්ටද හිරි හැර වන පරිදි මර ගි ගයති. මිය ගිය ඥාතියාටද අගෞරවයකි. ඔවුන් එම ක්‍රියාවන් දුක නිසා කරනවා යයි කීම "උඹේ කටෙත් පස් මගේ කටෙත් පස්" යයි කියා අන්දරේගෙ සීනි කෑම නොවේ ද? මිය ගිය ඥාතීන්ද ශාප කරනු නොඅනුමානය. ජීවත්වන කෙටි කාලය තුල මීට වඩා නිවැරදි දැකීමකින් කටයුතු කිරීමට පුරුදු වෙමු.

**අසාදැන ඉගෙන ගනිමු ("බහුස්සුතෝ")**

බොහෝ ඇසූ පිරූ තැන් ඇති බව, නොදන්නාකම දුරු කිරීමේ මාර්ගයකි. බුදුරජාණන් වහන්සේ බහුස්සුත භාවය බලාපොරොත්තු වූයේ පාළි ව්‍යාකරණ, සන්ධි, පූර්වාපර වශයෙන් සම්පූර්ණ තෙවලා දහමයි. ඒ මනුෂ්‍යයෙකුට යා හැකි පරම විශුද්ධිය වූ නිවනට පැමිණීම සඳහාය.

මෙහිදී අප තේරුම් ගතයුත්තේ සාමාන්‍ය ජීවිතයේදී බෞද්ධයකු වශයෙන් ඒ ඒ ජීවිත පැතිකඩවලදි ඇතිකර ගතයුතු දැනුමයි. එම දැණුම තුලින් සිත, කය, වචනය යන තුන්දොරින් සිදුවන වැරදි හෙවත් අකුසල් දුරුකරමින් නිවැරදි කුසල් වඩමින් පිරිසිදු ආත්මයක් පරිහරණය කරන්නෙක් බවට පත්වීමයි.

යමෙක් දැන උගත් වුවද ශීලාචාර නැත්නම් උගත්කමට ප්‍රශංසාද සිල්වත් කමට නින්දාද ලබති. සිල්වත් උගත් යන අංග දෙකින්ම යුතු නම් පරිපූර්ණ මිනිසකු ලබන පැසසුම් වලට හිමිකරුවෙකු වේ. ඔහුගේ ජීවිත පසුබිම තුල ඇසූ පිරූ තැන් බොහෝ ඇත.

අඩුම තරමින් පංචශීලයෙන් යුතුනම් වැරදි ක්‍රියා බොහෝ අඩුවේ. ප්‍රඥාව දියුණු කිරීමට එය හොඳටම ප්‍රමාණවත් වෙති. අද ඉවක් බවක් නැතිව ලෝකයේ තිබෙන ඕනෑම දෙයක් පිළිගන්නට තරම් අපි සූදානම්ව ඉන්නේ සීලාචාරකම පදනම්කරගත් දැනුම නැති කමයි. අපේ අවුරුදු සිරිත්වල අනවශ්‍ය දේ කිරීමට කාලය, ශ්‍රමය, ධනය වැය කරන්නේ ශීලාචාරකම පදනම්වූ දැණුම නැති නිසාය. විශේෂයෙන් සිංහල බෞද්ධයා ආර්ථික ප්‍රපාතයට යන දින කීපයකි මෙම අවුරුදු සමය. අලුත් අවුරුදු උදාවේ ප්‍රබෝධය අනපාගමික කූට වෙළඳුන්ගේ මුදල් පසුම්බි තුලට රිංගනුයේ අපේ නොදන්නාකම නිසයි. නොනගතයට විනාඩි කීපයක් තිබියදී බඩු ටික ගන්න යති. වෙළඳ සැල්තුල තිබෙන වසරක් පැරණි කුණු ගොඩවල් වුවද විකුණා ගන්නේ එවැන්නන්ටය. අධික සෙනග තදබදය නිසා හොඳ නරක තෝරා ගැනිමටද අවස්ථාව නැත. අද යුතුකම් චාරිත්‍ර කේක් ගෙඩියට, බිස්කට් පැකැට්ටුවට, සීනි ගොට්ටට සීමා වී ඇත්තේ අවුරුදු උත්සවය යනු ණය බරින් මිරිකී හෝ කාබී විනෝදවී විනාශකර මුදලින්ම සිදුකළයුතු උත්සවයක් ලෙස සිතන හෙයින්ය. ශාස්ත්‍ර නියමය වන්නේ ගත වූ වසරේ අඩු පාඩු හැරී බලා අභිනව වර්ෂයට අඩුපාඩු සකස්කරගෙන මුහුණ දීමයි. එහි නිරෝගිකම, සශ්‍රීකත්වය, සමගිය (මෛත්‍රිය) ආචාරශීලී බව පරිත්‍යාගය ආදී විවිධ ගුණ ඇත. වසරකට වරක් හෝ ගෙදර එන පවුලේ සාමාජිකයා මත්පැන් බී එම දින දෙක ගත කරයි නම් සිහිවිකල් වූ ඔහු නැවත රැකියාවට යන්නේ දූ පුතුන්ට කියාදිය යුතු බොහෝ පාඩම් කියා නොදීය. අවුරුදු චාරිත්‍ර පිළිබඳ දැන උගත්කමක් බාල පරපුරට ලබා දෙනුයේ අවුරුද්දකින් තරුණ වූ දූ පුතුන්ට කිරි ඉතිරෙන නව වසරකට ආසිරි ලබා දීමටය. බෞද්ධයෙකු වශයෙන් මෙම සිරිත් ඉගෙනනොගන්නනාක් එළදෙනගේ කිරි හෝ පොල්කිරි හෝ දියකළ පිටිකිරි (දැනට පවතින සිරිතකි.) කොතරම් ඉතිරෙව්වද ගෙදරට කිරි

නොඉතිරේ. හැලියේ කිරි තිබෙනතුරු ගින්දර තිබෙනතුරු ඉතිරේ. එය කොහොමත් සිදුවේ. එබැවින් සුභ නව වසරකට කිරි ඉතිරෙන්න නම් දැණුවත්කම අගනේය.

**ත්‍රිවිධ දුශ්චරිත දුරලමු ("පුඤ්ඤකරෝ")**

මෙලොව උපන් පුද්ගලයකු සිත යහපත් ලෙස පිහිටුවා යහපත් වචන කතා කොට නුවණ මෙහෙයවා යහපත් වැඩ කොට ජීවත්වන සුළු කාලය තුල බොහෝ දේ අසා දැන ඉගෙන කුසල් කරයිද? මරණින් මතු උප්පත්ති වශයෙන් සුගතියට පැමිණෙතැයි වදාළහ. තමන් නිවැරදිනම් නිවැරදි දේ කිරීමට බියවිය යුතු නැත. බියවිය යුත්තේ දුසිරිතයටය. දුසිරිත් දුරුකළ යුත්තේ මරණින් මතු දුගතියෙහි උපදින නිසාය. එහිදී දරුණු විපාක ඇතිවන නිසාය. ධනඤ්ජානි බ්‍රාහ්මණයාට සැරියුත් මා හිමියන් කියාදුන්නේ බිරිඳ නිසා හෝ දූ පුතුන් නිසා හෝ වැරදි නොකළ යුතු බවයි. විපාක විඳිනුයේ තමන්ම බැවිනි. ඉහාත්මයෙහි හෝ දෙවෙනි ආත්මයෙදි හෝ ජන්මාන්තරයෙහි හෝ දැන දැන කළ කර්මයන්ගේ විපාක නොවිඳ කෙළවර කිරීමක් නැති බව වදාළහ. සිංහල අවුරුද්ද නිසා හෝ මොනයම් කාරණයක් නිසා හෝ වැරදි ක්‍රියා වලින් වැළකීමට උත්සාහ ගන්නේනම් සම්මා දිට්ඨි කම්ම සමාදානය හෙවත් නිවැරදි කර්මයන්ගේ පිහිටීම ආර්යය මාර්ගයට පිවිසීමයි. වැරදි ක්‍රියා කිරීම අනාර්යය මාර්ගයයි. වර්ෂයක් හැදෙන්නේ තත්පර, විනාඩි, පැය, දවස්, සති, මාස වශයෙනි. හැම තත්පරයක්ම සිහිනුවණින් කටයුතු කරන්නේනම් තත්පරයෙන් නිර්මානය ආරම්භ වන අලුත් අවුරුද්ද පමණක් නොව නිවන්දකින තුරු අපාගත නොවී අලුත් වෙමින් සුභ වෙමින් පරම ශාන්තිය වන ජරමර දෙකින් තොර නිවනටද පත්වෙනු ඇත.

සාදු! සාදු!! සාදු!!!